දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

දේවිසා 3.1 - තුලනාත්මක දේශපාලනය
PSG 3.1 - Comparative Politics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත්අකුරින් පිළිතුරු සපයන්න

---

01. තුලනාත්මක දේශපාලනය නිර්වචනය කොට තත්කාලීන දේශපාලන සිදුවීම් විශ්ලේෂණය කිරීමට තුලනාත්මක දේශපාලන හැදෑරීම්වල අවශ්‍යතාව පෙන්වා දෙන්න.

02. තුලනාත්මක දේශපාලන විෂයේ සංවර්ධනයට ඇරිස්ටෝටල්ගේ දේශපාලන අදහස්වල දායකත්වය තක්සේරු කරන්න.

03. නූතන දේශපාලන ක්‍රම තුලනාත්මකව හැදෑරීමට චර්යාවාදී අධ්‍යයන ප්‍රවේශය යොදා ගැනීමේ වාසි හා අවාසි විශ්ලේෂණය කරන්න.

04. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කොට ව්‍යවස්ථා සම්පාදනයේ දී මුහුණ දීමට සිදුවන අභියෝග ශ්‍රී ලංකාවේ වත්මන් ව්‍යවස්ථා සම්පාදන අත්දැකීම් ඇසුරෙන් විභාග කරන්න.

05. පහත සඳහන් ඕනෑම එකක් විශ්ලේෂණය කරන්න.
   (අ) දේශපාලන සංස්කෘතිය (Political Culture)
   (ආ) ව්‍යුහ-කෘත්‍ය විශ්ලේෂණය (Structural-Functional Analysis)
   (ඇ) ස්ත්‍රීවාදය (Feminism)

06. බලපෑමේ කණ්ඩායමක් යනු කුමක්දැයි පැහැදිලි කොට එය දේශපාලන පක්ෂයකින් වෙනස් වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න.

07. (අ) මැතිවරණයක කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කොට මැතිවරණයක් සාධාරණ එකක් ලෙස හඳුනා ගැනීමට පැවතිය යුතු ලක්ෂණ පෙන්වා දෙන්න.

   (ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමානුපාතික නියෝජන ක්‍රමයේ යහපත් සහ අයහපත් ලක්ෂණ විවේචනාත්මකව විභාග කරන්න.

08. කැබිනට් ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ පෙන්වා දී එහි වාසි අවාසි විග්‍රහ කරන්න.

09. ශ්‍රී ලංකාවේ හා ඇමරිකා එක්සත් ජනපදයේ වර්තමාන ජනාධිපතිධූර වල බලතල සහ කාර්යභාරය තුලනාත්මකව පරීක්ෂා කරන්න.

10. පහත සඳහන් ඕනෑම දෙකක් (02) කෙටියෙන් විභාග කරන්න.
   (අ) මහජන මතය සහ ජනමාධ්‍ය
   (ආ) ශ්‍රී ලංකාවේ යෝජිත 20 වන ව්‍යවස්ථා සංශෝධනය
   (ඇ) ඩේවිඩ් ඊස්ටන්ගේ පද්ධති විශ්ලේෂණය
   (ඈ) නූතන විධායකයේ වෙනස්වන කාර්යභාරය